**ශීර්ෂය 166 - නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 166 - නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 39,335.87 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 30,291.07 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 9,044.80 ක් හෙවත් සියයට 22.99 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 213.13 | 210.87 | 2.26 | 1.06 |
| මූලධන | 39,122.74 | 30,080.20 | 9,042.54 | 23.11 |
| **එකතුව** | **39,335.87** | **30,291.07** | **9,044.80** | **22.99** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.14 | 3.80 | 2.94 | 4.89 | 27.00 | 11.52 |

2.3 **අග්‍රිම ගිණුම**

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0399/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 87.35 ක් විය.

2.4 **පොදු තැන්පත් ගිණුම්**

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 18.98 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0146/000 | 0.10 |
| 6000/0000/00/0013/0101/000 | 2.65 |
| 6000/0000/00/0016/0092/000 | 15.84 |
| 6000/0000/00/0018/0096/000 | 0.39 |
| එකතුව | **18.98** |

**2.5 විගණන නිරීක්ෂණය**

-----------------------

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3 ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ**

---------------------------------------

**3.1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් පොත්පත් පැවැත්වීම පිළිබඳව සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී මුදල් රෙගුලාසි 451 ප්‍රකාරව චෙක්පත් ලේඛනය පවත්වා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 845 ප්‍රකාරව දුරකථන ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම්**

----------------

**3.2.1 අයවැය විචලනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 504.61 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 22 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2.2 විසර්ජන ගිණුමේ හා ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අතර වෙනස්කම්**

------------------------------------------------------------------

විගණනයට ඉදිරිපත් කළ ව්‍යාපෘති දෙකකට අදාළ මූල්‍ය ප්‍රකාශන හා විසර්ජන ගිණුමේ එම ව්‍යාපෘති දෙකට අදාළ වියදම සම්බන්ධයෙන් පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට වියදම (විදේශ ණය) | විසර්ජන ගිණුම අනුව වියදම |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| ජල අංශ සංවර්ධන 11 ව්‍යාපෘතිය | 2,577.34 | 3,206 |
| අනුරාධපුරය උතුර ජලසම්පාදන ව්‍යාපෘතිය - 1 පියවර | 94.05 | 172.4 |

## 3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 16601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී 2013 ජූනි 07 දින සිට සේවයෙන් පහකළ නිලධාරියකුගේ හිඟ ණය ශේෂය රු.38,095 ක් නිරවුල් නොකර අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පවතින බව නිරීක්ෂණය විය.

## 3.4 පොදු තැන්පත් ගිණුම

මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ වූ ආරක්ෂිත තැන්පතුව රු. මිලියන 12.75 ක් ව්‍යාපෘතිය නිමවීමෙන් පසු 2014 වර්ෂයේදී අමාත්‍යාංශයට එවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.5.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2016 ජූලි 08 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සතු වාහන 02 ක් හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සතු වාහන 02 ක් නගර සැලැසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය විසින් පරිහරණය කර තිබුණි.

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු වාහන 03 ක් පරිහරණය කරන බව අමාත්‍යාංශය විසින් විගණනයට වාර්තා කළද, මණ්ඩලය සතු වාහන 09 ක් අමාත්‍යාංශයට මුදාහැර ඇති බව මණ්ඩලය විසින් විගණනයට වාර්තා කර තිබුණි. මණ්ඩලය විසින් එම වාහන වෙනුවෙන් 2015 වර්ෂයේදී ආදායම් බලපත්‍ර, රක්ෂණය, අළුත්වැඩියාවන් යනාදි වියදම් වෙනුවෙන් රු.421,459 ක් වියදම් කර තිබුණි.

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**---------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| ප්‍රාථමික මට්ටම | 24 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා |
| ද්විතියික මට්ටම | 10 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 1995 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා |
| තෘතියික මට්ටම | 02 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2012 වර්ෂයේ සිට 2015 වර්ෂ දක්වා |
| **එකතුව** | **36** | | |

ඉහත දැක්වෙන සේවකයින් 36 දෙනාට අදාළ වැටුප් හා වේතන ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ගෙවීම් කර තිබු අතර එම වියදම අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

## 3.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 571 | 11,100 | වැසි ජල ටැංකිය ඉදිකිරීමට අදාළව රඳවාගත් මුදල, වර්ෂ 2 කට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 1646 | - | වාහන භාර නිලධාරියා විසින් අමාත්‍යාංශයේ සංචිත වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | අමාත්‍යාංශය සතු වාහනවල සෑම මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |

## 3.8 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යනය යටතේ ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කර තිබුණි. 2015 වර්ෂයේ විසර්ජන ගිණුම අනුව එම ව්‍යාපෘති සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 10,300.42 ක් වූ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 3,062.42 ක් උපයෝජනය කර තිබුණි. මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

පහත විස්තර දැක්වෙන විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය පහත පරිදි විය.

| | ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කළ දිනය | මූල්‍ය කාර්යසාධනයේ ප්‍රතිශතය | භෞතික කාර්ය සාධනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| (i) | යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 2016.06.30 | 8.70 | 38.98 |
| (ii) | වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 2016.06.30 | 54.00 | 76.00 |
| (iii) | මහ කොළඹ ජල හා අප ජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 01 | 2016.12.31 | 21.68 | 6.45 |
| (iv) | මහ කොළඹ ජල හා අප ජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 02 | 2019.12.31 | 0.04 | 1.51 |

**(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම**

යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියට අදාළ ඉරණමඩු ජලාශයේ නව ජලය ලබාගන්නා ස්ථානයක් ඉදිකිරීම, පිරිපහදු නොකළ ජලය රැගෙනයාම සඳහා සම්ප්‍රේෂණ මාර්ගයක් ස්ථාපනය කිරීම, ජල පවිත්‍රාගාරය ඉදිකිරීම, පවිත්‍ර ජලය රැගෙන යන සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම යන කාර්යයන් සඳහා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ ණය පහසුකම් යොදා ගැනීමට නියමිතව තිබුණි. ජලය බෙදා ගැනීම සම්බන්ධයෙන් පැනනැගුණු ගැටළු හේතුවෙන් ඉරණමඩු ජලාශයෙන් ජලය ලබාගැනීමේ විකල්පය අත්හැර දැමීමට තීරණය කිරීම නිසා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ (AFD) ණය මුදලෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 124.64 ක් උපයෝජනය කර තිබුණි. ශ්‍රී ලංකා රජය දායකත්වය මත දරන අතිරේක වියදම් කළ එකතුව රු.මිලියන 27.11 ක්ද, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හෝ ජාතික ආර්ථිකයට ඵලදායකත්වයක් ලබා දී නොතිබුණි.

**(ඇ) රඳවාගත් ව්‍යාපෘති මුදල්**

ණය ගිවිසුම් අනුව පොලී ගෙවීමේ පදනම මත ලබාගත් ණය මුදල්, ක්‍රියාකාරී සැලැස්මට අනුව උපයෝජනය කර නොගැනීම නිසා යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය හා අනුරාධපුර උතුර පානීය ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ 2015 දෙසැම්බර් 31 දින දක්වා පිළිවෙලින් රු. මිලියන 76 ක හා රු.මිලියන 13 ක බැඳීම් ගාස්තු (commitment Charges) ගෙවීමට සිදු වී තිබුණි.

**3.9 අනාර්ථික ගනුදෙනු**

අමාත්‍යාංශයේ විදුලි බිල්පත් නියමිත දිනට පෙර නොගෙවීම නිසා රු. 18,071 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳව තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 27 | 20 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 05 | - | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 81 | 53 | 28 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40 | 36 | 04 |
| | **එකතුව** | **153** | **109** | **44** |